# කිළිනොච්චිය පසු කළෙමි.



අපි ඉතිහාසයේ මහා කඩතොළුවක් පසු කරමින් සිටියෙමු. ගොඩනැගිලි කිහිපයක හැර වහළ වල් ඉතිරිව තිබුණේ නැතිවා සේම ඉතිරිව තිබූ ඒවායේ බිත්ති අඟලින් අඟල සිදුරු වී ඇත. දොර ජනෙල් නම් ඇත්තේම නැත. කලෙක කොළ පැහැයෙන් දිලුම් දෙන්නට ඇතැයි සිතුන තල් අරඹ සහ ළඳු කැළෑ වෙනුවට දක්නට තිබුණේ මෝටාර් ප්‍රහාර වලින් තුරු හිස් සිඳ දැමුණු, දා ගිය තල් කඳන් හුදෙකලාව, ගිනියම් හිරු යටින්, කරසක සුළඟින් මැඬෙන අයුරුය.

A9 මග දිග හැරුණු කොට, බොහෝ බිම් පෙදෙස් කහ පටි වලින් සහ මිනී ඔළු සහිත සළකුණු වලින් අනතුරුදායක පෙදෙස් බවට අඟවා තිබේ. ඒවායේ බිම් බෝම්බ තවමත් ඉවත් කරමින් පවතියි. හාත්පස පැතිරී ඇත්තේ ,අනතුරුදායක, කැළෑ පඳුරු හා සිදුරු කරන ලද ගොඩනැගිලිය. නගරය මැද පුපුරවා පෙරළා දමනු ලද සුවිසල් වතුර ටැංකිය බිම වැතිර සිටියි. ඒ ඉදිරිපිට අටවා ගත් කඩ කිහිපයකි. පිළිවෙලකට ඇත්තේ යුධ හමුදා කඳවුරු හෝ මූලස්ථාන පමණි. විවිධ පැහැයෙන් යුත් ධජ ඒවායෙන් අහසට නැගෙයි.*

*කඳවුරු බිම නෙක පැහැ මල් වලින් අලංකෘතය. ඒවායෙන් පිටතට එන සෙබළුන්ගේ වෙහෙස සඟවන ලද මුහුණු අධිෂ්ඨානශීලීය, ප්‍රාණවත්ය.

යුධ හමුදාවට අමතරව සාමාන්‍ය වැසියෝද මෙහි වෙති. නින්දෙන් ඇවිදින්නාක් බඳු, නොපෙනෙන යමක් විසින් බියගන්වන ලද, සිනාසෙන්නට අමතකව ගිය, බොර පැහැ ඇස්වල කඳුළු තෙත නැති, සියවස් ගණනාවක් පෘථිවි අභ්‍යන්තරයේ සිර කරනු ලැබ සිට හිරු එළියට නිරාවරණය කරන ලද ඒ මිනිස්සු ජංගම බැංකුවක් අසල පොදි කමින් සිටිති. තමන් පසුකරමින් යාපනය "බලන්නට" යන දකුණේ මිනිසුන් රැගත් වාහන දෙස ඔවුහු බලා හිඳිති. ඒ බැල්මෙහි විස්මයක්, ප්‍රමෝදයක්, කෝපයක් මතු නොව උනන්දුවකුදු නැත. මූර්ති බඳු ඒ මුහුණු ඉතිහාසයේ දුක් වේදනා මිස වර්තමානයේ කිසිදු හැඟීමක් පිළිබිඹු නොකරයි.

බිඳ වැටුණු නගරයක් ...බිම වැටී, පෑගී, යළි නැගී , යළි යළි වැටී, රිදී ඔද්දල් වී අසීරුවෙන් පොළට මත සිටගෙන අන්දමන්දව වටපිට බලන මිනිසුන්.... සගයින් අහිමි කළ මතකයන් විසින් දිරි ගන්වනු ලබන, නිල ඇඳුම් තුළ හිඳින මිනිසුන් හෙවත් සෙබළුන්....

වාහනයේද කර්කශ සුළඟෙහිද හඬ අභිබවා ඒ ගොළු නගරයෙහි ආත්මය කෙඳිරි ගාන හරූ මට ඇසෙයි. ගොඩනැගිලි සිදුරු කළ උණ්ඩ මිනිසුන් සිදුරු කළ අයුරු ඉන් ඇසෙයි. විවිධ නම් වලින් හැඳින්වුණු, විවිධ ජාතීන්ට, ගෝත්‍ර වලට , ආගම් වලට අයත්ව සිටි , විවිධ නිළ ඇඳුම් හැඳ සටන් කළ, එහෙත් සිය මූලික ස්වභාවයෙන් මිනිසුන්ම වූ, මේ පොළව මත ඇද වැටී මිය ගිය ඔවුන්ගේ අවසාන සුසුම් මගේ සිරුර විනිවිද යනු මට දැනෙයි.

ඒ සුසුම් මුසු සුළඟින්, දා ගිය තල් ගස් වල කළු ගැසුණු පොතු බිම වැටෙයි. තවම සොයා නොගත්, වල දැමූ බිම් බෝම්බ මත පැළ වුණ කොළ පැහැ පඳුරු සෙමෙන් සෙලවෙයි. පෝලිම් වල බලා සිටින මිනිසුන්ගේද, නිළ ඇඳුම් හැඳ අවි දරණ මිනිසුන්ගේද, නගරය පසු කරන අපේද සිරුරුවල හී ගඩු නැගෙයි.

එවිට අපි අවදි වන්නට පටන් ගනිමු. සෙමින් ... පියවරෙන් පියවර....අළුත්ම අළුත් නොවුණ ද බලාපොරොත්තුවේ සුසුම්... සවිඥානිකව ඉහළ පහළ හෙළන්නට පටන් ගනිමු.

ඒවායින්, ඉතිහාසය පුරාවට බිත්ති වල සැදුණු සිදුරු වැසෙන්නට පටන් ගනියි.. අළුත් තල් පැළ ඒ සුසුම් වල රිද්මයට පොළවෙන් නැගෙන්නට පටන් ගනියි...දුහුවිලි මැදින් කාලය පණ ලබයි. එවිට , අනාගතයේ දිනෙක, ළමුන්, ගැහැණුන් හා වැඩ කරන මිනිසුන් විසින් මේ නගර යළි ගොඩ නගනු ඇත.

10.03.2010
යාපනයේ, නල්ලූර් හිඳී
**මාලතී කල්පනා ඇම්බ්‍රෝස්**

# තරු

මේ දවස්වල විශාල තරගයක් යනව ගී ගයන හැකියාවක් ඇති තරුව තෝරා ගැනීම ගැන. නාලිකා කීපයකම මේ තරග නිසා ඇත්තටම කොයි තරගය බලනවද කියලත් ගැටුමක් ඇති වෙනව. මේ තරග සියල්ලම සිංහලෙන් වගේම දෙමළ, ඉංග්‍රීසි බාසාවලිනුත් පවත්වන නිසා මේ කලබලය තවත් වැඩි වෙනව.




මැතිවරණ ආව ගියා කියලත් මේ තත්ත්වය වෙනස් වුණේ නැහැ. සමහරු මේ තරගවලට ඉතාම විරුද්ධයි. ඒ අය කියන්නේ මේවා සංගීතය පහළට හෙළන වෙළෙඳ වැඩපිළිවෙලවල් පමණයි කියලයි. ඒත් මේ ධනපති සමාජය තුළ ධනපතියන්ගෙන් මිස කාගෙන් යැපිලද කලාවට පැවැත්මක් තියෙන්නේ. ධනපති රාජ්‍යය උදව් කළ යුතුයි කිව්වත් ඒකත් දේශපාලන වැඩපිළිවෙලක් මිස නිදහස් කලාවට නිදහස් ඉඩක් ලබාගැනීමක් නෙවෙයි. එකම දේ මෙවන් දුප්පත් රටවල්වලට ලොකු මුදලක් යට කරන්න පුළුවන්කම තියෙන්නේත් රජයට පමණයි. ඒ අනුව සාරවත් පරිසරයක් රජයට හදල දෙන්න පුළුවන්. යටිතල පහසුකම් දෙන්න පුළුවන්. උදාහරණයකට කියන්න පුලුවන් ලංකාවේ ජාතික නාලිකාවෙන් දෙන ප්‍රචාරය හා අනෙකුත් පහසුකම් වෙන කිසිම කලාවකට දෙන්න බෑ. ඒත් රජයේ වැඩපිළිවෙලට, දේශපාලන බලපෑමට යටත් නිසා නිර්මාණශීලී දෙයක් කරන්න අමාරුයි කියල චෝදනා එල්ලවෙනව. කොහොම වුණත් ගායකයින්ගෙ තරග කලඑළියට ආවේ පුද්ගලික ආයතන මගින්. ඒවාට දැන් බැලුවහම ඉතාම ඉහළ දැනුම ඇති

*ඒ වගේම එවැනි ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු සැපයීමේදී ඇත්තේ එකම විදිය නිසා ප්‍රශ්න පත්‍ර බැලීමේදී විභාගකරුගේ ආකල්ප හෝ හැඟීම් අනුව ලැබෙන ලකුණු ප්‍රමාණය වෙනස් වීමට ඇත්තේ ඉතාම සුළු ඉඩක්. ඒත් ගී ගැයීම ගැන විනිශ්චය නම් එහෙම නැති බව අමල් පෙරේරා හා සිරිවර්ධන ගායිකාව අතර ඇති වන උණුසුම් විවාදවලින් එළි වෙනවා.*

ගායකයින් මෙන්ම සංගීතඥයන් විනිශ්චය සඳහා මෙන්ම අධ්‍යාපනය, ගුරුහරුකම් දීමට ඉදිරිපත් වෙලා තියෙනවා. ඒ නිසා වෙළෙඳාමක් සිදුවුණත් ගායන හැකියාව හා පුහුණුව පිළිබඳ විනිශ්චයක් ලැබෙන බව පිළිගන්න වෙනවා. විශේෂයෙන් අන්තිම තරගකරුවන් දොළොස්දෙනා දක්වා තේරීම් කරන්නේ දැනුම ඇති කලා විනිශ්චය මණ්ඩලයක් මගින්. මොකද? ඒ වගේම ඒ විනිශ්චයේ එක්තරා විනිවිදභාවයක් තියෙනවා, වාද විවාද කරල ගැටිල විනිශ්චය දෙන නිසා.

දැන් කලා හැකියාව කියන්නේ ඉතාම සියුම් හා විවිධ ලෙසට මතු වෙන දෙයක්. මොළයෙන් සිදු වන ප්‍රකාශන සංකල්ප හා හැඟීම් කියන ක්ෂෙත්‍ර දෙකට දමන්න පුළුවන්. සංකල්ප ඉදිරිපත් වෙන්නේ තර්ක රාමුව තුළ. ඒ නිසා එය තර්ක විශ්ලේශනයට භාජනය කරන්න පුළුවන්. මෙය හොඳින්ම පෙනෙන්නේ ගණිතමය ප්‍රකාශන ගත්තම. සංඛ්‍යා මගින් හෝ සංකේත මගින් ඉදිරිපත් වන ගණිතමය සූත්‍රයක් හරියාකාරව සකස්වූවක්ද කියල තර්කානුකූලව විමසලා බලන්න පුලුවන්. ඒ අනුව ගණිතය පිළිබඳ දැනුම, හැකියාව, මැනගැනීමට දැනට කරන විදියට පැය කිහිපයක් තුළ ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු සැපයීමට සැලැස්වීම ප්‍රමාණවත් ක්‍රමයක් හැටියට පිළිගන්න පුළුවන්. ඒ වගේම එවැනි ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු සැපයීමේදී ඇත්තේ එකම විදිය නිසා ප්‍රශ්න පත්‍ර බැලීමේදී විභාගකරුගේ ආකල්ප හෝ හැඟීම් අනුව ලැබෙන ලකුණු ප්‍රමාණය වෙනස් වීමට ඇත්තේ ඉතාම සුළු ඉඩක්. ඒත් ගී ගැයීම ගැන විනිශ්චය නම් එහෙම නැති බව අමල් පෙරේරා හා සිරිවර්ධන ගායිකාව අතර ඇති වන උණුසුම් විවාදවලින් එළි වෙනවා. එහෙම ගැටළු විශ්ව විද්‍යාලයේ ගණිත අංශයේ මහාචාර්යවරු දෙදෙනෙක් අතර ඇති වුණොත් එය ලෝක පුදුමයක්. නැත්නම් ගණිතමය වශයෙන් පිළිගත් මූලික තීන්දුවල ලොකු වෙනසකට තුඩු දෙන ප්‍රශ්නයක්. මං කියන්න හදන්නේ ගායනයේ හරි-වැරදි කියන අන්ත දෙක අතර අපැහැදිලි පරාසයක් තියෙනවා. නිකම්ම හරි-වැරදි කියල කියන්න බෑ. අසමත් හා විශිෂ්ඨයි යන්න බේරුම් කිරීම ගැටලු සහගතයි. වින්දනය, ගණිතමය සත්‍යය සමඟ කොහොමටත් සංසන්ධනය කරන්න බෑනේ. කෙනෙක් සියුම් ප්‍රබුද්ධ වින්දනයකට යන බව දැනගැනීමට විශාල අත්දැකීම් රාශියක් හරහා යා යුතුයි. හැඟීම්වල ලෝකය තුළ අන්ධකාරය බිඳගෙන යන පුදුම ගමනක් යා යුතුයි. හැඟීම් ලෝකය සාමාන්‍ය තර්කය තුළ වැඩ නොකළත් ඉතාම දරුණු මෙහෙයවීමක් තුළ සිදු වෙන්නේ. කලාකරුවා කියන්නේ

## අනන්තය



ආචාර්ය
**වික්‍රමබාහු කරුණාරත්න**

මේ මහා අද්භූතය තුළ රිසි ලෙස එහා මෙහා යමින් අමුතු, සියුම් වින්දනයක් එළිකරන දක්ෂ පුද්ගයෙකුට. අදහස් ලෝකය තුළ රජ කරන විද්වතෙකුට වඩා ඉතා සංකීර්ණ ඥාණයක් කලාකරුවා තුළින් එළි වෙනවා. ඒක සංකල්පමය විමසුමකට ලක් කරන එකත් අවදානම් වැඩක්.

මට නම් මේ තරුණ ගායකයන්ගේ ගායනා ගැනත්, විනිශ්චය කරන ප්‍රභූ සංගීතඥයන් නැත්නම් ගායකයින්ගේ තක්සේරු ගැනත් කියන්න තියෙන්නේ මෙච්චරයි. මං බලා සිටියේ විශ්මයෙන්. මොකද, මේ සිදු වෙන්නේ මගේ තර්ක ඥාණයට හඳුනාගෙන්න බැරි අමුතු දෙයක්. ඒ අය වචනවලින් කථා කළාට කියන්නේ මොකක්ද කියලා මගේ කලා දැනුම අනුව වටහා ගන්නත් බෑ.  හුඟක් අය හිතනව මං හොඳ මොළයක් තියෙන කෙනෙක් කියලා. ඒ මං ඉහළින් විභාග පාස් නිසා. විශේෂයෙන් ගණිතයෙන්. ඒත් මේ ගීත ලෝකය තුළ මං අසරණ මෝඩයෙක් හැටියටයි මට හැඟුණේ. කොහොමටත් ලක්ෂ ගණනක් අතරින් දොළොස් දෙනෙක් විශිෂ්ඨ හැටියට හොයල අපට දෙන එක ගැන මං නම් මේ විනිශ්චය මණ්ඩලයට ණයගැතියි. පුද්ගලික අංශවලින් කළත් මේවා ඇත්ත සහතික දීමේ වැඩපිළිවෙලවල්. අමල්, පැස්කුවෙල්, සිරිවර්ධන, ජගත් ආදී මේ හැම දෙනාටම එම ගරුත්වය දිය යුතුයි. නැටුම් ගැන කරන පරීක්ෂණත් ඒ වාගෙම ගැඹුරු වැඩපිළිවෙලවල් වෙන්න ඇති කියලත් මං හිතනවා. ඕවා ගැන විනිශ්චයන් දෙන්න මං කවුද? ■